# මැතිවරණ කොමිෂන් සභාව

## தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : 011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : 011-2868426

මැතිවරණ කොමිෂන් සභා කාර්යලය
සරණ මාවත,රාජගිරිය (10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய (10107)

*web : www.slelections.gov.lk e-mail : info@slelections.*


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/PRE/INQ<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2019.09.30<br>திகதி |

1. සියලුම අමාත්‍යාංශ ලේකම්වරු,
2. පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
3. දෙපාර්තමේන්තු ප්‍රධානීන්/පළාත් සභා අමාත්‍යාංශ ලේකම්වරුන්/ දිසාපතිවරුන්
4. රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
5. ආණ්ඩුකාරවර ලේකම්වරුන්,

**<u>තාවකාලික අනියම් (දෛනික) ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.</u>**

රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2019.09.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2019 ක්‍රියාත්මක කිරීමේ දී මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද EC/EDR/PRE-2019 හා 2019.09.18 දිනැති චක්‍රලේඛ අංක 01 කෙරෙහි හා මැතිවරණ කොමිෂන් සභාවේ 2019.09.19 දිනැතිව නිකුත් කරන ලද අංක 2141/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද විධාන පිළිබඳව ද ඔබගේ නිසි අවධානය යොමු කළ යුතු වේ.

02. ඔබ ද දන්නා පරිදි ජනාධිපතිවරණය පැවැත්වීම පිළිබඳ දැන්වීම 2018.09.18 වන දින නිකුත් කරන ලද බැවින් රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්, උසස් කිරීම් හා ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ නියමයන් මැතිවරණ කාලසීමාව තුළ ක්‍රියාත්මක වේ. මේ අනුව පත් කිරීම් ආදිය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඉහත චක්‍රලේඛ අංක 01 මගින් පැහැදිලිව දක්වා ඇත.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2019 නිකුත් කර ඇත්තේ ව්‍යවස්ථාපිත මැතිවරණ කාලසීමාවට පෙර ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වුව ද බඳවා ගැනීම් මැතිවරණ කාල සීමාව තුළ සිදු කරනු ලබන බැවින් මෙ සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන අනුගමනය කිරීමට ක්‍රියා කළ යුතුය.

i. මෙ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණ ද එය ක්‍රියාත්මක කිරීමේ දී කිසිදු දේශපාලනමය බලපෑමක් හෝ වෙනත් අයුරක අකටයුත්තක් සිදු නොවිය යුතු බවට වගබලා ගත යුතු ය.

ii. බඳවා ගැනීමට නියමිත සේවකයින්ගේ තනතුරට අදාළ සුදුසුකම් නියමිත පරිදි සපුරා තිබේ ද යන්න තහවුරු කර ගැනීම.

iii. (අ). සේවයේ යෙදී සිටිය යුතු වූ කාලසීමාවන් නියමිත පරිදි සපුරා ඇති බව පිළිබඳව නිසැක වීම.

(ආ). ඉහත (අ) හි සඳහන් කරුණු සම්බන්ධයෙන් පත්වීම් ලිපි, පැමිණීමේ ලේඛන හා වැටුප් ලේඛන ආදිය ආයතනයේ අභ්‍යන්තර විගණක විසින් පරීක්ෂා කර සනාථ කළ යුතු අතර අවශ්‍ය වුවහොත් මැතිවරණ කොමිෂන් සභාවේ මැතිවරණ පැමිණිලි විමර්ශන කාර්යාංශයේ නිලධාරීන්ට ද පරීක්ෂා කිරීමට ඉඩ දිය යුතු ය.

(ඇ). එමෙන්ම මේ සියලු කරුණු විගණකාධිපතිවරයා විසින් ස්වකීය කාර්ය මණ්ඩලය යොදවා පරීක්ෂා කරනු ලැබීමට යටත් ය.

iv. මෙයට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 හා සබැඳි 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හි 07 ඡේදය පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ. 2014.11.12 දිනෙන් පසුව සේවයට බඳවා ගෙන ඇති දැනට දින 180 ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයන් බඳවා ගැනීමේ දී 2014 වර්ෂයේ චක්‍රලේඛයේ 07 ඡේදයේ නියමවලට අනුකූලව ක්‍රියා කර ඇති බවට ඔබ නිසැක විය යුතු ය.

v. පුරප්පාඩු රහිතව හෝ නව තනතුරු රහිතව හෝ සේවයට බඳවා ගැනීම, දේශපාලනමය පත්වීම ලෙස සැලකිය යුතු බැවින් එවැනි සේවකයන් සඳහා ස්ථිර පත්වීම ලබා දීම නීති විරෝධී විය හැකි බව ද පෙන්වා දෙනු ලැබේ.

vi. පත්වීම් ලිපි ලබාදීමට පෙර ඉටුවිය යුතු සියලු කාරණා පිළිබඳව ආයතන ප්‍රධානියා වශයෙන් ඔබ සෑහීමකට පත්විය යුතුය.

vii. මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමර්ග පිළිබඳව ආයතන ප්‍රධානියා වශයෙන් ඔබ පෞද්ගලිකව වගකීමට යටත් වේ.

viii. මෙම පත්වීම් ලබාදීමේ දී අදාළ චක්‍රලේඛ විධිවිධානවලට බැහැරව ක්‍රියා කිරීම හා දේශපාලනමය බලපෑම් මත කටයුතු කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කර ඇති පෙර සඳහන් විධාන උල්ලංඝනය කිරීමක් වනු ඇති බව ද එවැනි විටක දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නීතිමය බැඳීම්වලට ද යටත්වීමට සිදු වනු ඇති බව ද දන්වා සිටිමි.

04. මේ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි හා ආයතන සංග්‍රහයේ අදාළ විධිවිධාන ද උපයෝගී කර ගනිමින්අපක්ෂපාතීව හා සාධාරණ අන්දමින් ක්‍රියා කළ යුතු බව වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව.
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.)

පිටපත් :

1. රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සාමාජිකයන් නම් කරනු ලබන ව්‍යවස්ථාපිත කොමිෂන් සභාවල ලේකම්වරුන්.
   - කාරුණික දැනගැනීම පිණිස හා නිසි කටයුතු සඳහා
2. විගණකාධිපති
   - දැනගැනීම පිණිස හා සෑම රාජ්‍ය ආයතනයකම මෙම බඳවා ගැනීම පිළිබඳව සොයා බැලීමට කරුණික වනු පිණිස.